අධ්‍යාපන අමාත්‍යාංශය

ක්‍රීඩා පාසල් සඳහා ක්‍රීඩා දක්ෂතා ඇති සිසුන් බඳවා ගැනීම - 2021

1. ක්‍රීඩා දක්ෂතා ඇති එමෙන්ම ඊට ඇල්මක් දක්වන සිසුන් සඳහා ඔවුන්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් වර්ධනය කිරීම අරමුණු කරගෙන අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පහත ක්‍රීඩා පාසල්වල 2021 වර්ෂයට සිසු සිසුවියන් බඳවා ගැනීමට ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අනු අං.	පාසලේ නම	පාසල් වර්ගීකරණය (මිශ්‍ර / බාලක/ බාලිකා)	ඉදිරියේදී විශේෂ පුහුණුව ලබාදීමට අපේක්ෂාකරන ක්‍රීඩාව
1	මහින්ද විද්‍යාලය, ගාල්ල	බාලක	බැඩ්මින්ටන්
2	විජිත විද්‍යාලය, දික්වැල්ල	මිශ්‍ර	වොලිබෝල්
3	රාජපක්ෂ මධ්‍ය ම.වි., වීරකැටිය	මිශ්‍ර	නෙට්බෝල්
4	තක්ෂිලාමධ්‍ය වි., හොරණ	මිශ්‍ර	වොලිබෝල්
5	හංවැල්ල රාජසිංහ ම.වි., හංවැල්ල	මිශ්‍ර	වොලිබෝල්
6	සේනානායකමධ්‍ය වි., මාදම්පේ	මිශ්‍ර	වොලිබෝල්
7	කුලියාපිටිය මධ්‍ය වි., කුලියාපිටිය	මිශ්‍ර	නෙට්බෝල්
8	අනුරාධපුර මධ්‍ය වි., අනුරාධපුර	මිශ්‍ර	පාපන්දු
9	රාජකීයවි., පොළොන්නරුව	මිශ්‍ර	බරඅසවීම
10	වැලිමඩමධ්‍ය වි., වැලිමඩ	මිශ්‍ර	ජූඩෝ
11	සීවලී මධ්‍ය ම. වි., රත්නපුර	මිශ්‍ර	පාපන්දු
12	සුමන බාලිකා වි., රත්නපුර	බාලිකා	නෙට්බෝල්
13	ඩබ්ලි සේනානායක වි., තෝලංගමුව	මිශ්‍ර	වොලිබෝල්
14	වීරකැප්පෙටිපොළ මධ්‍ය වි., අකුරම්බොඩ	මිශ්‍ර	වොලිබෝල්
15	ඩී.එස්.සේනානායක ම.වි., අම්පාර	මිශ්‍ර	පාපන්දු
16	ශාන්ත ජෝෂප් වි., ත්‍රිකුණාමලය	බාලක	පාපන්දු
17	ශාන්ත මේරි කන්‍යාරාමය, ත්‍රිකුණාමලය	බාලිකා	නෙට්බෝල්
18	යාපනය මධ්‍ය විද්‍යාලය, යාපනය	බාලක	පාපන්දු
19	පොරමඩුල්ල මධ්‍ය විද්‍යාලය, රිකිල්ලගස්කඩ	මිශ්‍ර	වොලිබෝල්
20	සංඝමිත්තා බාලිකා විද්‍යාලය, ගාල්ල	බාලිකා	නෙට්බෝල්
21	ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය, ඉබ්බාගමුව	මිශ්‍ර	වොලිබෝල්
22	හේනේගම මධ්‍ය විද්‍යාලය, හේනේගම	මිශ්‍ර	වොලිබෝල්
23	වලල ඒ රත්නායක ම.වි., මැණික්හින්න	මිශ්‍ර	මල්ලවපොර
24	ආණමඩුව මධ්‍ය මහා විද්‍යාලය, ආණමඩුව	මිශ්‍ර	වොලිබෝල්
25	සූරියවැව ක්‍රිකට් ක්‍රීඩා පාසල	බාලක	ක්‍රිකට්
26	මහින්ද රාජපක්ෂ විද්‍යාලය, හෝමාගම	මිශ්‍ර	මලල ක්‍රීඩා
27	පැල්වත්ත නවෝද්‍යා විද්‍යාලය, බුත්තල	මිශ්‍ර	වොලිබෝල්
28	මුරුන්ගන් මධ්‍ය මහා විද්‍යාලය, මන්නාරම	මිශ්‍ර	පාපන්දු
29	මහානාම විද්‍යාලය, මොණරාගල	මිශ්‍ර	පිහිණුම්
30	හින්දු විද්‍යාලය, රත්මලාන	මිශ්‍ර	පාපන්දු

- මෙම පාසල් අතුරින් සූරියවැව ක්‍රීඩා පාසල ක්‍රිකට් ක්‍රීඩාව සඳහාම විශේෂිත ක්‍රීඩා පාසලක් ලෙස ආරම්භ කරන අතර අනෙකුත්ක්‍රීඩා පාසල්වල මලල ක්‍රීඩාවට අමතරව හඳුනාගත් එක් සුවිශේෂී ක්‍රීඩාවක් සංවර්ධනය කෙරේ.

2. **අයදුම් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්**
   - i. 2020 වර්ෂයේ 07 ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන සිසුවකු සිසුවියක වීම.
   - ii. ක්‍රීඩා තරගවලින් ජයග්‍රහණය කර තිබීම හෝ ක්‍රීඩාවන් සඳහා වූ විශේෂ ඇල්මක් දක්වන අයවලුන් වීම.
   - **තෝරාගනු ලබන සිසු-සිසුවියන් නේවාසික වීම අනිවාර්ය වේ.**

3. **තෝරාගන්නා ක්‍රමවේදය**
   - i. ප්‍රායෝගික පරීක්ෂණයක් මඟින්
   - සියලුම සිසුන් වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

4. **තෝරාගන්නා සිසුන්ට ලැබෙන ප්‍රතිලාභ**
   - i. විශේෂඥ පුහුණුකරුවන් යටතේ පුහුණු අවස්ථා හිමිවීම.
   - ii. ආහාරපාන හා අවශ්‍ය අනෙකුත් පහසුකම් සලසා දීම.
   - iii. නේවාසික පහසුකම් හිමිවීම.
   - iv. සාමාන්‍ය අධ්‍යාපන කටයුතුවලට අමතරව නේවාසික කාලය තුලද අධ්‍යාපන කටයුතු සිදුකිරීම.
   - v. ක්‍රීඩා පාසල් අතර වාර්ෂිකව පවත්වනු ලබන ජාතික මට්ටමේ තරඟාවලියට සහභාගී වීමට අවස්ථාව ලැබීම.
   - vi. ක්‍රීඩාව අනුව පුහුණු උපකරණ ලබාදීම.
   - vii. පාසල් අධ්‍යාපනයෙන් පසු අධ්‍යාපන සුදුසුකම් අනුව උසස් අධ්‍යාපන ප්‍රවේශ අවස්ථාවන්ට යොමු කිරීම.

උක්ත සුදුසුකම් සපුරාලන, ක්‍රීඩා පාසලට ඇතුළත් වී තම දක්ෂතා දියුණු කරගැනීමට අපේක්ෂා කරන සිසු සිසුවියන් වේ නම් පහත සඳහන් ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් 2021.01.22 දිනට ප්‍රථම "අධ්‍යාපන අධ්‍යක්ෂ, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා, අධ්‍යාපන අමාත්‍යාංශය,, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය.

සැ.යු.: අයදුම්පත්‍රය බහාලන ලද කවරයෙහි වම්පස ඉහළ කෙළවර "ක්‍රීඩා පාසල් සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2021" යනුවෙන් සටහන් කර ඉල්ලුම් කරනු ලබන පාසලෙහි නමද ලියා එවිය යුතු ය.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

.....

විද්‍යාලයීය ක්‍රීඩා පාසල සඳහා ඇතුලත් වීම - 2021

අයදුම් පත්‍රය

1. ශිෂ්‍යයා / ශිෂ්‍යාවගේ සම්පූර්ණ නම.....
2. මුලකුරු සමඟ නම.....
3. උපන්දිනය.....
4. ලිපිනය .....
5. මවගේ/පියාගේ/භාරකරුගේ නම.....
6. දුරකථන අංකය.....
7. දැනට අධ්‍යාපනය ලබන පාසල.....
8. දැනට (2020) ඉගෙනුම ලබන ශ්‍රේණිය -
9. පාසල අයත් කලාපය හා දිස්ත්‍රික්කය.....
10. ක්‍රීඩා සඳහා ලබා ඇති ජයග්‍රහණ (තිබේ නම්).....
11. විශේෂිත හැකියාවක් දක්වන ක්‍රීඩාව.....

මාගේ දරුවා මනා සෞඛ්‍ය තත්වයෙන් සිටින බවත්,උක්ත ක්‍රීඩා පාසල සඳහාතෝරාගතහොත් නේවාසිකව අධ්‍යාපනය ලැබීමට එකඟ වන බවත්, ඉහත දක්වා ඇති කරුණු සත්‍ය හා නිවැරදි තොරතුරු බවටත් ප්‍රකාශ කර සිටිමි.

.....
දිනය

.....
මවගේ/පියාගේ අත්සන

ඉහත නම් සඳහන් සිසුවා/සිසුවිය අප පාසලේ දැනට අධ්‍යාපන කටයුතු හදාරන බව සහතික කරමි.

.....
දිනය

.....
විදුහල්පතිගේ අත්සන හා නිලමුද්‍රාව